# 11 ශ්‍රේණිය

## පාඩම : නර්තන කලාවේ සාමාජීය හා අධ්‍යාපනික ප්‍රවණතා

## ( නිපු.අං. 5.1 )

- 1934 වර්ෂයේ රබීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ පැමිණීමත් සමඟ නර්තන කලාවේ නව ප්‍රබෝධයක් ඇති වීමට පසුබිම සකස් විය.
- පාරම්පරික ගුරු කුල වලට පමණක් සීමා වී තිබූ නර්තන කලාව පොදු ජනයා අතර ප්‍රචලිත වීම.
- නර්තනය ඉගෙනීම/ඉගැන්වීම සඳහා පාසල් අධ්‍යාපනයට නර්තන විෂය ඇතුළත් වීම හා ගුරුවරුන් පත් කිරීම.
- දේශීය නර්තනයට මුද්‍රා නාට්‍ය , ඉඟිනළු වැනි , නව ක්‍රම ඇතුලත් වීම.
- නර්තන ශිල්පීන් හට ජාතික හා අන්තර්ජාතික මට්ටමට පිවිසීමට අවස්ථා උදාවීම.

  නිදසුන් :- එක්ස්පෝ 67 වැනි ප්‍රදර්ශන වලට සහභාගි වීම
- 1952 රජයේ ලලිත කලායතනය ආරම්භ වීම
- 1956 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු කලායතන බිහිවීම.
- 1972 දී රජයේ පාසල් වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වීම හා එම වසරේ දී ම සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගිරාගම සෞන්දර්ය ගුරු අභ්‍යාස විද්‍යාලය ආරම්භ කිරීම.
- 1978 වර්ෂයේ දී අ.පො.ස ( උ / පෙළ ) සඳහා නර්තනය විෂයක් ලෙස ඇතුළත් වීම.
- උසස් අධ්‍යාපනය සඳහා 1974 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොට සෞන්දර්ය අධ්‍යයන ආයතනය ආරම්භ කිරීම.
- 2005 වර්ෂයේදී කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම. ( වර්තමාන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය )
- නර්තනය විෂය සඳහා ආචාර්යවරුන් , මහාචාර්යවරුන් බිහිවීම හා උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගත වීමට අවස්ථා උදාවීම.
- විවිධ ආයතන බිහිවීම.

  නිදසුන් :- ජාතික තරුණ සේවා සභාව , සංස්කෘතික මධ්‍යස්ථාන
- විවිධ නර්තන කණ්ඩායම් බිහිවීම.

  නිදසුන් :- ත්‍රිවිධ හමුදා හා පොලිස් නර්තන කණ්ඩායම් , රාජ්‍ය නර්තන කණ්ඩායම , පළාත් හා පෞද්ගලික නර්තන කණ්ඩායම්
- තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීම.

  නිදසුන් :- දියුණු ආලෝකකරණ ශිල්ප ක්‍රම , දියුණු වේදිකා ශිල්ප ක්‍රම හා පසුබිම් සංගීත උපක්‍රම
- දේශීය නර්තනය සඳහා පෙරාපර දෙදිග ශිල්පීය ක්‍රම යොදා ගැනීම.
- පර්යේෂණ මඟින් විවිධ නර්තන කෘති රචනා වීම.
- වාණිජකරණය හේතු කොටගෙන නර්තනය සඳහා කාන්තා දායකත්වය සීඝ්‍ර ලෙස වර්ධනය වීම.

පැවරුම **01**

1) මූලික වශයෙන්ම නර්තන කලාවේ ඇති වූ ප්‍රබෝධයට මුල් වූයේ කුමන කරුණු ද ?
.................................................................................................................................................

2) නර්තන කලාවේ සිදුවුන ප්‍රබෝධය හේතුවෙන් ඇතිවූ නව ප්‍රවණතා තුනක් ලියන්න.
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

3) 70 දශකයේ අධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ සිදු වූ සිදුවීම් පෙළ ගස්වන්න.
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

4) ශ්‍රී ලාංකික නර්තන ශිල්පීන් අන්තර්ජාතික තලයට පිවිසීම , නර්තන කලාවට බලපෑ අයුරු පිළිබඳ කරුණු දක්වන්න.
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

5) තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ කරුණු පිළිබඳ ලිපියක් සකස් කරන්න.
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

6) නර්තන කලාවේ ප්‍රවණතාවයක් වශයෙන් මෙකල බිහි වූ නර්තන කණ්ඩායම් මොනවා ද?
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

පැවරුම **02 - හිස්තැන් සම්පූර්ණ කරන්න.**

1) ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලය ................................ වර්ෂයේ දී ආරම්භ විය.

2) වර්ෂ ................................ දී කැලණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යන ආයතනය පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට උසස් කරන ලදී.

3) රබීන්ද්‍රනාත් තාගෝර් තුමා ලංකාවට පැමිණියේ ................................ වර්ෂයේදී ය.

4) රජයේ ලලිතකලායතනය ................................ වර්ෂයේ දී බිහි විය.

5) අ.පො.ස ( උ / පෙළ ) විෂයයක් ලෙස නර්තන විෂය ................................ වර්ෂයේ දී පාසල් විෂය මාලාවට එක් කරන ලදී.

6) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ආරම්භ වූයේ ................................ වර්ෂයේ දී ය.

7) වර්ෂ ................................ දී රජයේ පාසල්වල නර්තන විෂය ඉගැන්වීම ආරම්භ කරන ලදී.

8) කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධව සෞන්දර්ය අධ්‍යාපන ආයතනය වර්ෂ .................................. දී ආරම්භ කරන ලදී .

සැකසුම :

රවිඳු පලිහවඩන

නර්තනය විෂය ආචාර්ය

හලා / වෙන් / මැල්ලව කණිෂ්ඨ විද්‍යාලය